# <u>කලන 2020</u>

## <u>ප්‍රාසාංගික, මාධ්‍ය කලා හා සාහිත්‍ය තරගාවලිය හා සම්මාන උළෙල</u>

කැලණිය විශ්වවිද්‍යාලයීය කලා මණ්ඩලය විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ කලා කුසලතා ඔප් නැංවීමේ හවුල්කරුවෙකු ලෙස කලන 2020 ප්‍රසාංගික, මාධ්‍ය කලා හා සාහිත්‍ය තරගාවලිය හා සම්මාන උළෙල සිව්වන වරටත් ප්‍රදානය කරනු ලබයි. මෙවර සියලු තරග අංශ මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ ක්‍රියාත්මක වේ.

- **තරග අංශ**

1. කෙටි කතා තරගය (සිංහල, දෙමළ, ඉංග්‍රීසි)
2. පද්‍ය කාව්‍ය (සිංහල, දෙමළ, ඉංග්‍රීසි)
3. ගේය පද රචනා (සිංහල, දෙමළ, ඉංග්‍රීසි)
4. ඒකාංගික නාට්‍ය
5. ගායන තරග අංශය (ඒකල ගැහැණු/ඒකල පිරිමි)
6. නර්තන තරග අංශය (ඒකල)
7. කෙටි චිත්‍රපට
8. චිත්‍ර
9. ඡායාරූප
10. සංගීත නිර්මාපක (Music Composer)
11. සන්නිදර්ශක හා සජීවිකරණ නිර්මාණ (Illustrator and Animation)
12. එකලස් කලා (Assemble Art)
13. හොඳම ගීත රූප රචනය
14. මෝස්තර නිර්මාණකරනය

ජයග්‍රහන සඳහා සම්මාන හා සහතික පත්‍ර ප්‍රදානය

- ඒකාංගික නාට්‍ය - **මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර** අනුස්මරණ සම්මානය
- කෙටි චිත්‍රපට - **ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්** අනුස්මරණ සම්මානය
- ගායනා - **ආචාර්ය ඩබ්. ඩී. අමරදේව** අනුස්මරණ සම්මානය
- වාදන - **ආචාර්ය ප්‍රේමසිරි කේමදාස** අනුස්මරණ සම්මානය
- පද්‍ය කාව්‍ය හා ගේය පද රචනා - **කුමාරතුංග මුණිදාස** අනුස්මරණ සම්මානය
- චිත්‍ර - **සෝලියස් මෙන්ඩිස්** අනුස්මරණ සම්මානය
- ඡායාරූප - **විල්සන් හැගොඩ** අනුස්මරණ සම්මානය

- **තරග මාර්ගෝපදේශ**

තරග සඳහා ඉදිරිපත් කරන සෑම නිර්මාණයක් ම ස්වතන්ත්‍ර (තමන්ගේම) මුල් කෘති වි යුතුය. අයදුම්කරුවන්ට සුදුසු ඕනෑම තේමාවක් ඕනෑම ශෛලියක් තෝරාගත හැකිය. එක් විද්‍යාර්ථියෙකුට තරග අංශ තුනක් සඳහා ඉදිරිපත් විය හැකි අතර එක් තරග අංශයක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ නිර්මාණ දෙකක් පමණි. අදාළ තරග සහ එක් එක් නිර්මාණය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් තරග සඳහා සහභාගි විය හැකිය. සම්පූර්ණ නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- **තරග කොන්දේසි**

01. ඒකාංගික නාට්‍ය තරගය

- විනාඩි 15 කට නොවැඩි විය යුතුය. නාට්‍ය පිටපත් පළමුව කලා මණ්ඩලයෙන් අනුමත විය යුතු අතර ඒ සඳහා නාට්‍ය පිටපතක් යොමු කළ යුතුය. අනුමත වූ පිටපත් කලා මණ්ඩලයෙන් පසුව දැනුම් දෙනු ලැබේ. පිටපත් අනුමත වූ තරගකරුවන් සිය නාට්‍ය නිර්මාණය වීඩියෝ ගත කර MP4 වීඩියෝ පටයක් ලෙස E-mail හෝ Whatsapp මාර්ගයෙන් යොමු කළ යුතුය. වීඩියෝ පටය සංස්කරණය නොකළ යුතුය.

02. කෙටි චිත්‍රපට

- විනාඩි 5 කට නොවැඩි විය යුතුය. 2020 වර්ෂයේ ජනවාරි 01 වන දිනෙන් පසුව නිපදවන ලද නිර්මාණ තරගය සඳහා විවෘතව පවතී. තාක්ෂණික හා ගුණාත්මක දෝෂයකින් තොරව ඉදිරිපත්

කිරීම තරගකරුවන්ගේ වගකීමකි. චිත්‍රපටය MP4 වීඩියෝ පටයක් ලෙස E-mail හෝ Whatsapp මාර්ගයෙන් යොමු කළ යුතුය.

03. සංගීත නිර්මාපක

- විනාඩි 3කට නොවැඩි විය යුතුය. ස්වතන්ත්‍ර නිර්මාණයක් විය යුතුය. වෙනත් නිර්මාපකයෙකුගේ නිර්මාණයකින් උපුටාගත් සංගීත ඛණ්ඩ ඇතුළත් නිර්මාණ අවලංගු කෙරේ. අදාළ නිර්මාණය MP3 සහ Wave යන දෙයාකාරයෙන් ම E-mail හෝ Whatsapp මාර්ගයෙන් යොමු කළ යුතුය.

04. කෙටිකතා

- කෙටිකතා සංග්‍රහ වශයෙන් නොව කේවල කෙටිකතා ලෙස ඉදිරිපත් විය යුතු අතර ඒවා ප්‍රකාශයට පත් නොකළ නිර්මාණ විය යුතුය. වෙනත් නිර්මාණකරුවකුගේ නිර්මාණ කෘතියකින් හෝ සංග්‍රහයකින් උපුටාගත් නිර්මාණයක් හෝ කොටසක් ඇතුළත් නිර්මාණ තරගය සඳහා සළකා බලනු නොලැබේ. අකුරේ ප්‍රමාණය 12 විය යුතු අතර FMAbhaya අකුරින් ටයිප් කළ යුතුය. කෙටිකතා පිටපත PDF ලෙස සකසා E-mail හෝ Whatsapp මාර්ගයෙන් යොමු කළ යුතුය.

05. පද්‍ය කාව්‍ය

- පද්‍ය කාව්‍ය සංග්‍රහ වශයෙන් නොව කේවල පද්‍ය කාව්‍ය ලෙස ඉදිරිපත් විය යුතු අතර ඒවා ප්‍රකාශයට පත් නොකළ නිර්මාණ විය යුතුය. කාව්‍යයට මාතෘකාවක් තිබිය යුතුය. අකුරේ ප්‍රමාණය 12 විය යුතු අතර FMAbhaya අකුරින් ටයිප් කළ යුතුය. පද්‍ය කාව්‍ය පිටපත PDF ලෙස සකසා E-mail හෝ Whatsapp මාර්ගයෙන් යොමු කළ යුතුය.

06. ගේය පද රචනා

- ස්වතන්ත්‍ර නිර්මණයක් විය යුතු අතර ප්‍රකාශයට පත් නොකළ නිර්මාණයක් විය යුතුය. අකුරේ ප්‍රමාණය 12 විය යුතු අතර FMAbhaya අකුරින් ටයිප් කළ යුතුය. ගේය පද රචනා පිටපත PDF ලෙස සකසා E-mail හෝ Whatsapp මාර්ගයෙන් යොමු කළ යුතුය.

07. ගායන

- කාලය උපරිම විනාඩි 5කි. ඒකල වශයෙන් තරග පැවැත්වෙන අතර දක්‍ෂතම ගායකයා හා ගායිකාව වෙන් වෙන් වශයෙන් තෝරනු ලැබේ. ගායන පහසුව සඳහා වාද්‍ය භාණ්ඩයක් උපයෝගී කරගත හැකිය. මැදිරියක පටිගත කරන ලද ගායනාවන් තරගය සඳහා වලංගු නොවේ. ගීත ගායනාව සජීවිව ගායනා කර වීඩියෝ ගත කොට E-mail හෝ Whatsapp මාර්ගයෙන් යොමු කළ යුතුය.

08. නර්තන

- කාලය උපරිම විනාඩි 10කි. ඒකල තරග වශයෙන් පැවැත්වෙන අතර සජීවී නර්තනය වීඩියෝ ගත කොට සංස්කරණය නොකර E-mail හෝ Whatsapp මාර්ගයෙන් යොමු කළ යුතුය.

09. ඡායාරූප

- ජංගම දුරකථන ඡායාරූප (Mobile Photography) හා කැමරා ඡායාරූප (DSLR Photography) යන අංශ දෙකෙන් ම වෙන් වෙන් වශයෙන් තරග පැවැත්වේ. ස්වාභාවිකව ගන්නා ලද ඡායාරූප විය යුතුය. ගුණාත්මක භාවය තිබිය යුතුය. ඩිජිටල් ප්‍රයෝග භාවිතා නොකළ යුතුය. සෑම තරගකරුවකුටම ඡායාරූප 3ක් ඉදිරිපත් කළ හැකිය. කළු සුදු ඡායාරූප ඉදිරිපත් කළ හැකිය. Tone කිරීමට ඉඩ දෙනු නොලැබේ. සියලුම ඡායාරූප JPG ලෙස සකසා E-mail හෝ Whatsapp මාර්ගයෙන් යොමු කළ යුතුය. සිය ඡායාරූප ජංගම දුරකථන ඡායාරූප ද(Mobile Photography) හා කැමරා ඡායාරූප ද (DSLR Photography) යන්න සඳහන් කර එවීම අනිවාර්ය වේ.

10. චිත්‍ර

- තෙල් සායම්, දිය සායම් හෝ වෙනත් ඕනෑම මිශ්‍ර මාධ්‍යයක් භාවිතා කළ හැකිය. චිත්‍රයෙහි ප්‍රමාණය තීරණය කිරීමට නිර්මාණකරුට නිදහස ඇත. නිර්මාණ තැපැල් මාර්ගයෙන් කලා මණ්ඩලය වෙත යොමු කළ යුතුය. චිත්‍රයෙහි පිටුපස තරගකරුගේ නම, විශ්වවිද්‍යාලය, අධ්‍යයන අංශය, අධ්‍යයන වර්ෂය සහ ශිෂ්‍ය අංකය සඳහන් කර එවීම අනිවාර්ය වේ.

11. සන්නිදර්ශක (2D) හා සජීවීකරණ (3D) - Illustrator and Animation

- කාලය විනාඩි 2කට නොවැඩි විය යුතුය. අදාළ නිර්මාණ MP4 වීඩියෝ පටයක් ලෙස සකසා E-mail හෝ Whatsapp මාර්ගයෙන් යොමු කළ යුතුය.

12. මෝස්තර නිර්මාණකරණය

- නිර්මාණයේ දළ සටහනක් සහ නිර්මාණය පිළිබඳ විස්තර කිරීමක් ඇතුළත් වීඩියෝ පටයක් E-mail හෝ Whatsapp මාර්ගයෙන් යොමු කළ යුතුය.

13. එකලස් කලා (Assemble Art)

- නිර්මාණය සඳහා ඕනෑම අමුද්‍රව්‍යයක් භාවිත කළ හැකි අතර අදාළ නිර්මාණයට තැපැල් මාර්ගයෙන් කලා මණ්ඩලය වෙත යොමු කළ යුතුය.

14. හොඳම ගීත රූප රචනය

- රූප රචනය MP4 වීඩියෝ පටයක් ලෙස සකසා E-mail හෝ Whatsapp මාර්ගයෙන් යොමු කළ යුතුය.

සෑම නිර්මාණයක් සමඟම තරග අංශය, තරගකරුවාගේ නම, අධ්‍යනාංශය, අධ්‍යයන වර්ෂය සහ ශිෂ්‍ය අංකය සඳහන් කර එවිය යුතුය. විවෘත තරග වලංගු වන්නේ රජයේ ලියාපදිංචි විශ්වවිද්‍යාලවල අධ්‍යයනය සිදුකරනු ලබන විද්‍යාර්ථීන්ට පමණි. විවෘත තරග සඳහා නිර්මාණ යොමු කිරීමේ දී තම විශ්වවිද්‍යාලයේ නම සඳහන් කර එවිය යුතුය.

මාර්ගගත ක්‍රමයෙන් (Online) එවිය යුතු නිර්මාණ පහත සඳහන් Gmail ලිපිනයට හෝ පහත සඳහන් දුරකථන අංකයට Whatsapp මාර්ගයෙන් යොමු කළ හැකිය.

**Gmail address - kalana2020competition@gmail.com**

**Whatsapp - 0720830738**

තැපැල් මාර්ගයෙන් එවිය යුතු නිර්මාණ පහත ලිපිනයට යොමු කල යුතුය.

**සභාපති,**

**කලා මණ්ඩලය,**

**කැලණිය විශ්වවිද්‍යාලය,**

**කැලණිය.**

- අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය - 2021.02.01
- නිර්මාණ භාර ගැනීමේ අවසන් දිනය - 2021.03.01